ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2002 අංක 2 දරන බලශක්ති සැපයුම් (තාවකාලික විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2002 මාර්තු මස 21 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 මාර්තු මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 15.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.25 යි.

# 2002 අංක 2 දරන බලශක්ති සැපයුම් (තාවකාලික විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2002 මාර්තු මස 21 වන දින]

**බලශක්ති සැපයුම් කමිටුවක් පිහිටුවීම සඳහා ද ; ඒ කමිටුව විසින් ඇතැම් වෙනත් නීති යටතේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද ; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඩු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 2002 අංක 2 දරන බලශක්ති සැපයුම් (තාවකාලික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය හැකි නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## I වන පරිච්ඡේදය

## බලශක්ති සැපයුම් කමිටුවේ සංයුතිය

බලශක්ති සැපයුම් කමිටුවේ සංයුතිය.

2. (1) (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) බලශක්ති සැපයුම් කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කමිටුව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම් –

(i) කමිටුවේ සභාපතිවරයා විය යුතු භාණ්ඩාගරයේ ලේකම්වරයා ;

(ii) විදුලිබල හා බලශක්ති විෂයය භාර අමාත්‍යවරයා ගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(iii) ව්‍යවසාය සංවර්ධන, කර්මාන්ත ප්‍රතිපත්ති හා ආයෝජන ප්‍රවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(iv) ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා ;

(v) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයා ;

(vi) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(vii) ජාතික බලශක්ති සභාවේ සභාපතිවරයා ;

(viii) 8 වන වගන්තිය යටතේ පත් කරනු ලබන බලශක්ති නියාමක ; සහ

(ආ) ප්‍රතිපත්ති සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබ, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ප්‍රතිපත්ති සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ විෂයය භාර අමාත්‍යාංශයේ නියෝජිතයෙක්.

(3) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු, අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් සිය ධූරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ හේතු දක්වා අමාත්‍යවරයා විසින් ප්‍රතිපත්ති සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ විෂයය භාර අමාත්‍යවරයා විමසා ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, තමා පත් කරනු ලැබූ දින සිට අවුරුදු දෙකක කාලයක් ධූර දැරිය යුතු ය.

(4) කමිටුවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හයදෙනකු විය යුතු අතර කමිටුව විසින්, කමිටුවේ රැස්වීම් සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල දී කරනු ලබන කටයුතු විධිමත් කරනු ලැබිය හැකි ය.

## II වන පරිච්ඡේදය

## කමිටුවේ අරමුණු, බලතල සහ කර්තව්‍ය

කමිටුවේ අරමුණු.

3. කමිටුවේ අරමුණු වනුයේ –

(අ) විදුලිබල ශක්තිය, ඛනිජතෙල් හා වෙනත් බලශක්ති අවශ්‍යතාවල ප්‍රමාණවත් සැපයුමක් ලබා දෙන බවට වගබලා ගැනීම ;

(ආ) විදුලිබල ශක්තිය ලබාදීම, ඛනිජ තෙල් සැපයුම සහ වෙනත් බලශක්ති සම්පත් ප්‍රයෝජනයට ගැනීම විධිමත් කිරීම.

4. කමිටුව විසින් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කළ යුතු ය :— කමිටුවේ බලතල.

(අ) (i) විදුලිය ;

(ii) සියලු ආකාරවල ඛනිජ තෙල් නිෂ්පාදන,

මිලදී ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් ක්‍රියා කිරීම,

(ආ) සියලු ආකාරවල අලුත් කළ හැකි බලශක්ති සම්පත් පිළිබඳව කවරාකාරයකින් හෝ ක්‍රියා කිරීම ;

(ඇ) විදුලි මීටර් වැනි උපකාරක උපකරණ මිලදී ගැනීම හෝ ඒවා සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් ක්‍රියා කිරීම සහ පෞද්ගලික අංශය මගින් එවැනි උපකරණ මිලදී ගැනීම සඳහා යෝජනා ක්‍රම සකස් කිරීම ;

(ඈ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා ලංකා විදුලිබල මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයේ සියලු අංශවල පිරිවැය ඵලදායකත්වය පිළිබඳව සහතික වීම ;

(ඉ) බලශක්ති සංරක්ෂණය සහ වෙනත් බලශක්ති සම්පත් ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකිරීම සහතික වීම පිණිස අවශ්‍ය විය හැකි ආකාරයේ ක්‍රියාමාර්ග ගැනීම.

5. කමිටුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා කමිටුව විසින් පහත දැක්වෙන කර්තව්‍ය ඉටු කරනු ලැබිය හැකි ය:— කමිටුවේ කර්තව්‍ය.

(අ) ප්‍රමාණවත් බලශක්ති සැපයුමක් ලබාදීම සහතික වීම පිණිස ජාතික සැලැස්මක් පිළියෙල කිරීම ;

(ආ) පවත්නා විදුලිබල ශක්තිය සහ ඛනිජ තෙල් ප්‍රමාණයන් ලබාගැනීමේ හැකියාව පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයක් සකස් කිරීම සහ එම විදුලිබල ශක්තිය සහ ඛනිජ තෙල් භාවිතය පිළිබඳ වැඩසටහනක් පිළියෙල කිරීම ;

(ඇ) මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති කරුණු සම්බන්ධයෙන් බලපත්‍ර දීමේ, නියාමනය කිරීමේ සහ පරීක්ෂා කිරීමේ කර්තව්‍ය ඉටු කිරීම ;

(ඇ) (i) විදුලි බල ශක්තිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම, සැපයුම සහ භාවිතය ;

(ii) ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, අපනයනය කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ සැපයුම,

පිළිබඳ සියලු කරුණු සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම ;

(ඉ) විදුලිබල ශක්තිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදහැරීම, සැපයුම සහ භාවිතයට අදාළ සහ ඛනිජ තෙල් හා ඛනිජ තෙල් නිෂ්පාදන බෙදාහැරීම, සැපයුම සහ භාවිතයට අදාළ තොරතුරු එකතු කිරීම සහ වාර්තාගත කිරීම ;

(ඊ) (i) ලංකා විදුලිබල මණ්ඩලය හෝ විදුලිය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදාහැරීම, සැපයුම හෝ භාවිතය පාලනය කිරීම සඳහා නීතිය මගින් නම් කරනු ලැබිය හැකි වෙනත් යම් අධිකාරියක් ;

(ii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හෝ ඛනිජතෙල් සහ ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය කිරීම, අපනයනය කිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම සහ සැපයුම පාලනය කිරීම සඳහා නීතිය මගින් නම් කරනු ලැබිය හැකි වෙනත් යම් අධිකාරියක්,

අධීක්ෂණය කිරීම හා ඒවාට විධාන නිකුත් කිරීම ;

(උ) (i) විදුලිය උත්පාදනය කිරීමෙහි, සම්ප්‍රේෂණය කිරීමෙහි, බෙදාහැරීමෙහි, සැපයුමෙහි සහ භාවිතයෙහි ;

(ii) ඛනිජතෙල් හා ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය කිරීමෙහි, අපනයනය කිරීමෙහි, ගබඩා කිරීමෙහි, බෙදාහැරීමෙහි සහ සැපයුමෙහි,

නියැලී සිටින සියලු තැනැත්තන්ගේ ක්‍රියාකාරකම් විධිමත් කිරීම ;

(ඍ) හැකිතාක් දුරට –

(i) විදුලිය අඛණ්ඩව උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදාහැරීම සහ සැපයුම ;

(ii) ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදනය අඛණ්ඩව ආනයනය කිරීම, අපනයනය කිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම සහ සැපයුම,

සහතික කිරීම සඳහා අවශ්‍ය විය හැකි ක්‍රියාමාර්ග ගැනීම ;

(එ) විදුලිය සැපයීම සඳහා කලින් කල අයබදු සහ වෙනත් ගාස්තු විධිමත් කිරීම සහ නියම කිරීම ;

(ඒ) (i) විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම සහ සැපයුමට අදාළ කටයුතුවල නියැලී සිටින තැනැත්තන්ගේ කාර්යක්ෂමතාව, ආර්ථිකය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම මඟින් විදුලිබලය ;

(ii) ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදන, ආනයනය කිරීම, අපනයනය කිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම සහ සැපයුමට අදාළ කටයුතුවල නියැලී සිටින තැනැත්තන්ගේ කාර්යක්ෂමතාව, ආර්ථිකය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම මඟින් ඛනිජතෙල් සහ ඛනිජතෙල් නිෂ්පාදන,

සැපයුම සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ;

(ඔ) (i) විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම සහ සැපයුම හා සම්බන්ධ වානිජ සංවිධානවල නියැලී සිටින තැනැත්තන් විසින් මෙහෙයුම්

කටයුතුවලට මුදල් යෙදවීම සහ ඒ කටයුතු පවත්වාගෙන යාම කාර්යක්ෂම ලෙස ඉටු කරන බවට ;

(ii) ඛනිජතෙල් සහ ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය කිරීම, අපනයනය කිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම සහ සැපයුම හා සම්බන්ධ වානිජ සංවිධානවල නියැලී සිටින තැනැත්තන් විසින් ඒ මෙහෙයුම් කටයුතුවලට මුදල් යෙදවීම සහ ඒ කටයුතු පවත්වාගෙන යාම කාර්යක්ෂම ලෙස ඉටු කරන බවට,

වගබලා ගැනීම සහ සහතික වීම ;

(ඕ) (i) විදුලිය උත්පාදනයෙන්, සම්ප්‍රේෂණයෙන්, බෙදාහැරීමෙන් සහ සැපයුමෙන් ;

(ii) ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමෙන්, අපනයනය කිරීමෙන්, ගබඩා කිරීමෙන්, බෙදාහැරීමෙන් සහ සැපයීමෙන්,

පැනනගින අවදානම් තත්ත්වයන්ගෙන් මහජනයා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විය හැකි ක්‍රියාමාර්ග ගැනීම ;

(ක) විදුලිය, ඛනිජතෙල් සහ ඛනිජතෙල් නිෂ්පාදන කාර්යක්ෂම ලෙස භාවිත කිරීම සහ සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම;

(ග) විදුලිය සහ වෙනත් විදුලි බල ශක්ති වර්ග උත්පාදනය කිරීමේ හා නිෂ්පාදනය කිරීමේ විකල්ප සහ පිරිමැසුම්දායි සම්පත් සහ ක්‍රම හඳුන්වා දීම සහ භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම ;

(ච) කමිටුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ උපකාරි විය හැකි වූ ද අමාත්‍ය මණ්ඩලය විසින් කමිටුව වෙත යොමු කරනු ලබන්නා වූ ද වෙනත් යම් කටයුතු භාර ගැනීම ;

(ජ) මේ පනත යටතේ කමිටුවේ කර්තව්‍යවලින් යම් කර්තව්‍යයක් එලදයි ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය සහ උචිත යයි කමිටුව සලකන සියලු ආනුෂංගික සහ උපකාරක කටයුතු භාරගැනීම.

6. ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී, කමිටුව, රජයේ බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව අමාත්‍යවරයා විසින් කමිටුව වෙත නිකුත් කරනු ලබන යම් විශේෂ හෝ සාමාන්‍ය විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

කමිටුව ස්වකීය බලතල අමාත්‍යවරයාගේ විධානවලට යටත්ව ක්‍රියාත්මක කළ යුතු බව.

7. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, කමිටුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා කමිටුව විසින් සකස් කරනු ලබන සැළසුම් සහ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම, අවස්ථාවෝචිත පරිදි ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කාර්යය විය යුතු ය.

කමිටුව විසින් සකස් කරනු ලබන සැළසුම් සහ වැඩපිළිවෙල ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ක්‍රියාත්මක කළ යුතු බව.

## III වන පරිච්ඡේදය

## කමිටුවේ කාර්ය මණ්ඩලය

8. (1) කමිටුවේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින් කමිටුවේ බලශක්ති නියාමක ලෙස තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර ඒ තැනැත්තා කමිටුවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

බලශක්ති නියාමක.

(2) බලශක්ති නියාමක ලෙස පත් කරනු ලබන යම් තැනැත්තකුට තිබිය යුතු සුදුසුකම් ද, ඒ තැනැත්තා පත් කරනු ලැබිය හැක්කේ කුමන නියම හා කොන්දේසිවලට යටත්ව ද ඒ නියම හා කොන්දේසි ද, ඒ නියාමකවරයාට ගෙවනු ලැබිය යුතු වැටුප සහ වෙනත් දීමනා ද අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(3) කමිටුව විසින් අවශ්‍ය යයි සලකනු ලබන බලතල කමිටුව විසින් බලශක්ති නියාමක වෙත පවරනු ලැබිය යුතු ය.

(4) මේ පනත මගින් බලශක්ති නියාමක වෙත පවරා ඇති හෝ පනවා ඇති හෝ වෙන් කර ඇති යම් බලතල, කර්තව්‍ය හෝ කාර්යය, බලශක්ති නියාමක විසින් අවශ්‍ය යයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක දී කමිටුවේ අනුමැතිය ඇතිව, මේ පනතේ 10 වන වගන්තිය යටතේ, සේවය ලබාගෙන ඇති යම් තැනැත්තකු වෙත පවරනු ලැබිය හැකි අතර ඒ තැනැත්තා විසින්, බලශක්ති නියාමකගේ සාමාන්‍ය සහ විශේෂ විධානවලට යටත්ව එම බලතල ක්‍රියාත්මක කිරීම ද කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීම ද සිදු කළ යුතු ය.

කමිටුවේ අනෙක් කාර්ය මණ්ඩලය.

9. (1) අමාත්‍ය මණ්ඩලය විසින් කමිටුවේ නිලධාරීන් සහ සේවකයන් ලෙස පත් කළ යුතු තැනැත්තන්ගේ –

(අ) සුදුසුකම් තීරණය කිරීම සහ බඳවා ගැනීම් පරිපාටිය සකස් කිරීම ;

(ආ) නියම සහ කොන්දේසි නිශ්චිතව දැක්වීම,

සිදු කළ යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා කමිටුව විසින් කමිටුවේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන් පත් කරනු ලැබිය යුතු අතර ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ විනය පාලනය කමිටුව වෙත පැවරිය යුතු ය.

අවස්ථාවෝචිත පරිදි ලංකා විදුලිබල මණ්ඩලයේ හා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවය කමිටුවට ලබාදිය යුතු බව.

10. කමිටුවේ ඉල්ලීම පිට, අවස්ථාවෝචිත පරිදි ලංකා විදුලිබල මණ්ඩලයේ හෝ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ සේවය, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව, විශ්‍රාම වැටුප් හෝ සේවක අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළුව, කමිටුව එකඟ වන නියම හා කොන්දේසි මත කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා කමිටුව වෙත ලබාදිය හැකි ය.

## IV වන පරිච්ඡේදය

### සාමාන්‍ය

චංචල දේපළ අධිග්‍රහණය කිරීම.

11. (1) යම් චංචල දේපළක් මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරනු ලබන (මෙහි මින් මතු "අධිග්‍රහණ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්, ඒ නියමයෙහි නිශ්චිතව දැක්වෙන චංචල දේපළ, ඒ නියමයෙහි නිශ්චිතව දැක්වෙන දිනයෙහි සිට බලපවත්වන පරිදි අධිග්‍රහණය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අධිග්‍රහණ නියමයකට, ඒ නියමයෙහි නිශ්චිතව දැක්වෙන දේපලෙහි සන්තකය ලබා ගැනීම සහ පනතේ කාර්ය සඳහා ඒ දේපළ පාවිච්චි කිරීම සඳහා කමිටුවට භාරදීමට ලේකම්වරයාට බලය පවරන බලපෑම තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලේකම්වරයා විසින් අධිග්‍රහණය කරනු ලබන දේපළක්, ලේකම්වරයා විසින් කරනු

ලබන (මෙහි මින් මතු "අනධිග්‍රහණ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) අනධිග්‍රහණ නියමයක් මගින් ඒ අනධිග්‍රහණ නියමයේ නිශ්චිතව දැක්විය යුතු දිනයක සිට බලපැවැත්වෙන පරිදි අනධිග්‍රහණය කරනු ලැබිය හැකි ය.

(4) (අ) (1) වන උපවගන්තිය යටතේ අධිග්‍රහණය කරනු ලබන යම් චංචල දේපළක් සම්බන්ධයෙන් වන වන්දි මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය ;

(ආ) (අ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව ගෙවිය යුතු වන්දි මුදලේ ප්‍රමාණය තක්සේරු කිරීම සහ ඒ වන්දි මුදල ප්‍රදානය කිරීමේ ආකාරය නියම කරනු ලැබිය යුතුය.

රජයේ නිශ්චල දේපළ කමිටුවට ලබාදිය හැකි බව.

**12.** රජයේ යම් නිශ්චල දේපළක් කමිටුවේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක, රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධයෙන් විශේෂ ප්‍රදානයක් හෝ බදු දීමක් කළ හැකි කාර්යයක් ලෙස ඒ කාර්යය සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන ඒ දේපළ විශේෂ ප්‍රදානයක් හෝ බදු දීමක් ලෙස කමිටුවට ලබා දීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මේ පනත යටතේ හෝ කමිටුවේ විධානය මත සිදු කරනු ලබන ක්‍රියා සඳහා ආරක්ෂාව.

**13.** මේ පනත යටතේ හෝ කමිටුවේ විධානය මත කමිටුවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා එම සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට එරෙහිව කිසිම අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

ගිවිසුම් සහ නඩු.

**14.** (1) කමිටුවේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, කමිටුව සඳහා සහ කමිටුව වෙනුවෙන් බලශක්ති නියාමක ගිවිසුම්වලට ඇතුළත් විය යුතු අතර, කමිටුව සංස්ථාවක් වූවාක් සේ ඒ ගිවිසුම් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) කමිටුවේ බලතල ක්‍රියාත්මක කිරීමට සහ කර්තව්‍ය ඉටු කිරීමට අදාළ සියලු නඩු, කමිටුව සංස්ථාවක් වූවාක් සේ, කමිටුව විසින් හෝ එයට එරෙහිව හෝ පවරනු ලැබිය යුතු ය.

කමිටුව, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**15.** කමිටුව, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අමාත්‍යවරයා වෙත තොරතුරු සැපයීම.

**16.** කමිටුවේ වැඩ සම්බන්ධයෙන් වන වාර වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘති පත්‍රවල අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල කමිටුවට විධාන කළ හැකි අතර, එවැනි යම් විධානයක් කමිටුව විසින් පිළිපැදිය යුතු ය.

වැරදි.

**17.** මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් කඩකරන හෝ මේ පනත යටතේ නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

වැරදි සඳහා දණ්ඩන.

**18.** (1) මේ පනත යටතේ වරදකට වරදකරුවන යම් තැනැත්තෙක්, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන දහයකට වැඩි නොවන දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී-

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙක් ම සහ නිලධරයෙක් ම ;

(ආ) එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් එම ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවෙකු ම,

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුවද, ඒ වරද ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකුගේ හෝ නිලධරයකුගේ හෝ ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවෙකුගේ අනුදැනුම ඇතිව සිදු කරනු නොලැබූ බවට ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ හවුල්කරු ඔප්පු කරන්නේ නම් හෝ නැතහොත්

ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ හවුල්කරු තිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බවට ඔප්පු කරන්නේ නම් ඒ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා හෝ හවුල්කරු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

19. (1) නියම කරනු ලැබීමට මේ පනත මගින් නියම කර ඇති කරුණු සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය පවරනු ලැබ ඇති කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි, පහත දැක්වෙන කරුණුවලින් යම් කරුණක් හෝ සියලු කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :–

(අ) ජන ජීවිතයට අත්‍යවශ්‍ය විදුලි බල ශක්තිය, ඛනිජ තෙල් සහ වෙනත් බල ශක්ති සම්පත්වල ප්‍රමාණවත් සහ අඛණ්ඩ සැපයුම ;

(ආ) බලශක්ති ව්‍යාපෘතිවල ආරක්ෂාව සඳහා අනුගමනය කළ යුතු කොන්දේසි ;

(ඇ) විදුලි බල ශක්තිය සංරක්ෂණය සහ භාවිතය සඳහා අවශ්‍ය විය හැකි පියවර.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර ඒවා එසේ පළකරනු ලබන දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව ම සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එය යටතේ කලින් කරන ලද යම් දෙයකට හානියක් නොවන පරිදි එම අනනුමතයේ දින සිට අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

කමිටුවේ වාර්තාව අමාත්‍යවරයා වෙත යැවිය යුතු බව සහ එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බව සහ ඒ වාර්තාවේ පිටපත් මහජනතාවට මිලදී ගැනීමට ඉඩ සැලසිය යුතු බව.

**20.** (1) කමිටුවේ එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු, හැකි පහසු ඉක්මනින්, ඒ වර්ෂය තුළ කමිටුවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් සහ කමිටුවේ සැළැස්ම සහ වැඩ පිළිවෙල පිළිබඳව අමාත්‍යවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. ඒ වර්ෂය සඳහා වූ වාර්තාවේ දී අමාත්‍යවරයා විසින් කමිටුව වෙත ඒ වර්ෂය තුළ දෙන ලද කවර හෝ විධානයක් සඳහන් කර තිබිය යුතු ය.

(2) ඒ වාර්තාව කමිටුව විසින් අමාත්‍යවරයා වෙත යවනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු ය.

(3) එම වාර්තාව කමිටුවේ වියදමින් මුද්‍රණය කිරීමට සැලැස්විය යුතු අතර කමිටුව විසින් තීරණය කරනු ලැබිය යුතු මිලකට එය මහජනයාට මිලදී ගැනීම සඳහා කමිටුව විසින් කටයුතු සැළැස්විය යුතු ය.

අලුත් බලශක්ති ව්‍යාපෘතියක් අනුමත කිරීමට පෙර අමාත්‍යවරයා විසින් මධ්‍යම පරිසර අධිකාරයෙන් වාර්තාවක් ලබාගත යුතු බව.

**21.** (i) විදුලි බල ශක්තිය උත්පාදනය කිරීමට, සම්ප්‍රේෂණය කිරීමට, බෙදා හැරීමට හෝ සැපයුමට;

(ii) බණිජතෙල් සහ බණිජතෙල් නිෂ්පාදන ආනයනය කිරීමට, අපනයනය කිරීමට, ගබඩා කිරීමට, බෙදා හැරීමට හෝ සැපයුමට,

අදාළ යම් ව්‍යාපෘතියක් සඳහා අනුමතය ප්‍රදානය කිරීමට පෙර කමිටුව විසින් යෝජිත ව්‍යාපෘතියෙහි පාරිසරික බලපෑම පිළිබඳව ජාතික පාරිසරික පනත යටතේ පිහිටුවනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරියෙන් වාර්තාවක් ලබාගත යුතු ය.

(2) කමිටුව විසින්, අමාත්‍යවරයා විමසීමෙන් පසු සහ මධ්‍යම පරිසර අධිකාරියේ වාර්තාවේ අන්තර්ගත කරුණු නිසි පරිදි සැලකිල්ලට ගැනීමෙන් පසු, (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යාපෘතියක් සඳහා අනුමතිය ලබා දිය යුතු ය.

මේ පනතේ විධිවිධාන යටතේ කරන ලද යම් දෙයක් ඇතැම් නීති අභිබවා බලපැවැත්විය යුතු බව.

**22.** 21 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පීඩාකාරී ආඥාපනතෙහි සහ ජාතික පාරිසරික පනතෙහි, දණ්ඩ නීති සංග්‍රහයේ 261 වන වගන්තියේ සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 98 වන වගන්තියෙහි පටහැනිව කුමක් සඳහන් වුවද, මේ පනතේ විධිවිධාන යටතේ කරන ලද යම් දෙයක් බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ ඉහත කී නීතිවල විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

## II වන කොටස

### වෙනත් නීති යටතේ බලතල ක්‍රියාත්මක කිරීම

ලංකා විදුලිබල මණ්ඩලය පනතේ V වන කොටස යටතේ කමිටුව විසින් බලතල ක්‍රියාත්මක කළ යුතු බව.

**23.** නියමිත දිනයේ සිට සහ ඉන් පසුව ලංකා විදුලිබල මණ්ඩල පනතෙහි පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද කලින් කල සංශෝධිත ලංකා විදුලිබල මණ්ඩල පනතේ V වන කොටසේ නිශ්චිතව දක්වා ඇති බදු සහ ගාස්තුවලට අදාළ බලතල ඒ කොටසේ විධිවිධානවලට අනුකූලව කමිටුව විසින් ක්‍රියාත්මක කළ යුතු අතර මේ පනත ක්‍රියාත්මක වන තාක් කල් ලංකා විදුලිබල මණ්ඩලය විසින් එම කොටස යටතේ බලතල කිසිවක් ක්‍රියාත්මක නොකළ යුතු ය. තව ද ඒ කොටසෙහි හෝ ඒ කොටස යටතේ සාදන ලද යම් නියෝගයක හෝ නියමයක "මණ්ඩලය" ට කරන ලද යම් සඳහනක් පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස "කමිටුව" යන්නට කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

විදුලිබල මණ්ඩල පනතේ 2 සිට 11 දක්වා වූ වගන්ති යටතේ කමිටුව විසින් බලතල ක්‍රියාත්මක කිරීම.

**24.** (1) නියමිත දින සිට සහ එදිනට පසුව විදුලිබල මණ්ඩල පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, කලින් කල සංශෝධිත විදුලිබල මණ්ඩල පනතේ 2 සිට 11 දක්වා වූ වගන්ති යටතේ විදුලිබල ශක්තිය සැපයීම සම්බන්ධයෙන් බලපත්‍ර දීමට අදාළ බලතල එකී වගන්තිවල විධිවිධානවලට අනුකූලව කමිටුව විසින් ක්‍රියාත්මක කළ යුතු අතර මේ පනත ක්‍රියාත්මකව පවතින තාක් කල් ඒ වගන්තිය යටතේ යම් බලතල කිසිවක් අමාත්‍යවරයා විසින් ක්‍රියාත්මක නොකළ යුතු ය.

තව ද ඒ වගන්තිවල හෝ ඒ වගන්ති යටතේ සාදන ලද යම් නියෝගයක "අමාත්‍යවරයා" යන්නට කරන ලද යම් සඳහනක්, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස "කමිටුව" යන්නට කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

(2) කමිටුව, (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යවරයාගේ විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත් විය යුතු ය.

ඛනිජ තෙල් නිෂ්පාදන (සැපයීම විධිමත් කිරීමේ හා පාලනය කිරීමේ) පනත යටතේ නිසි බලධරයාගේ බලතල කමිටුව විසින් ක්‍රියාත්මක කළ යුතු බව.

**25.** නියමිත දින සිට සහ එදිනට පසුව ඛණිජ තෙල් නිෂ්පාදන (සැපයුම විධිමත් කිරීමේ සහ පාලනය කිරීමේ) පනතෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද එම ඛනිජ තෙල් නිෂ්පාදන (සැපයුම විධිමත් කිරීමේ හා පාලනය කිරීමේ) පනත යටතේ නිසි බලධරයාගේ බලතල හා කර්තව්‍ය එකී පනතේ විධිවිධානවලට අනුකූලව කමිටුව විසින් ක්‍රියාත්මක කළ යුතු අතර ඒ පනත ක්‍රියාත්මකව පවත්නා තාක් නිසි බලධරයා විසින් ඒ පනත යටතේ වන බලතල වලින් කිසිවක් ක්‍රියාත්මක නොකළ යුතු ය.

තව ද ඒ පනතේ හෝ ඒ පනත යටතේ සාදන ලද නියෝගයක "නිසි බලධරයා" යන්නට කරන ලද යම් සඳහනක් පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස "කමිටුව" යන්නට කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

අවස්ථාවෝචිත පරිදි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, අමාත්‍යවරයා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 5ආ සිට 5එ, 34අ, 42 යටතේ ක්‍රියාත්මක කරන ලද අයිතිවාසිකම් සහ බලතල කමිටුව විසින් ක්‍රියාත්මක කිරීම.

**26.** නියමිත දින සිට සහ එදිනට පසුව කමිටුව විසින් ස්වකීය කර්තව්‍ය යථාපරිදි ඉටු කිරීමේ දී, කමිටුව විසින් අවශ්‍ය සහ යෝග්‍ය යයි සලකනු ලබන අවස්ථාවන්හි දී –

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත මගින් පිහිටුවන ලද ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත එකී පනතේ 5ආ, 5ඇ, 5ඈ සහ 34ආ වගන්ති මගින් පැවරී ඇති අයිතිවාසිකම් වලින් අයිතිවාසිකම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය ; හෝ

(ආ) ඉහත කී පනතේ 5ආ, 5ඉ, 5ඊ, 5උ, 5ඌ, 5එ සහ 42 වන වගන්ති යටතේ අවස්ථාවෝචිත පරිදි අමාත්‍යවරයා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල හෝ විශේෂ බලතල වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

තවද කමිටුව විසින් එකී අයිතිවාසිකම් හෝ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි සංස්ථාව විසින් හෝ අමාත්‍යවරයා විසින් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ මේ පනත ක්‍රියාත්මකව පවතින තාක් කල් ඒ වගන්ති යටතේ වූ බලතල ක්‍රියාත්මක නොකළ යුතු ය.

තවද ඒ වගන්තිවල අවස්ථාවෝචිත පරිදි "සංස්ථාව" "අධ්‍යක්ෂ මණ්ඩලය" හෝ, "අමාත්‍යවරයා" යන යෙදුම්වලට කරන ලද යම් සඳහනක්, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, "කමිටුව" යන යෙදුමට කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

විශේෂ විධිවිධාන නිකුත් කිරීමේ බලතල.

**27.** (1) ලංකා විදුලිබල මණ්ඩල පනත, විදුලිබල පනත, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත සහ ඛනිජ තෙල් නිෂ්පාදන (විධිමත් කිරීමේ සහ සැපයුම පාලනය කිරීම) පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, අවස්ථාවෝචිත පරිදි 23, 24, 25 හෝ 26 වන වගන්ති යටතේ කමිටුව වෙත පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි විශේෂ විධිවිධාන, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව –

(අ) ලංකා විදුලිබල මණ්ඩල පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ලංකා විදුලිබල මණ්ඩලය සහ ඒ මණ්ඩලයේ යම් නිලධරයකුට හෝ සේවකයකුට ;

(ආ) විදුලිබල පනතේ 2 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් බලපත්‍රයක් දරන්නකුට ;

(ඇ) ඛනිජතෙල් නිෂ්පාදන (විධිමත් කිරීමේ සහ සැපයීම පාලනය කිරීමේ) පනතේ 2 වන වගන්ති යටතේ පත්කරනු ලැබූ නිසිබලධරයකුට සහ ඒ වගන්තිය යටතේ පත් කරනු ලැබූ ඛනිජතෙල් අධිකාරී, යම් නියෝජ්‍ය ඛනිජතෙල් අධිකාරී හෝ යම් ඛනිජතෙල් සහාය අධිකාරිවරයකුට ; සහ

(ඈ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනතේ 2 වන වගන්තිය මගින් පිහිටුවනු ලැබූ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ඒ සංස්ථාවේ යම් නිලධරයකුට සහ සේවකයකුට

නිකුත් කිරීමට කමිටුවට බලතල තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් විධානයන් දෙනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා ඒ විධානයන්ට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

**28.** (1) ලංකා විදුලි බල මණ්ඩල පනතේ හෝ එකී පනතේ විධි විධාන යටතේ එළඹුන යම් කොන්ත්‍රාත්තුවක හෝ ගිවිසුමක පටහැනිව කුමක් සඳහන් වුවද, ජාතික ආර්ථිකයේ යහපත උදෙසා සහ කමිටුවේ බලතල හා අයිතිවාසිකම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කඩිනම් පියවර ගැනීමේ අදහසින්, ගාස්තු හා අයකිරීම් පැනවීමේදී යම් විශේෂ කාර්ය පටිපාටියක් අනුගමනය කිරීමට කමිටුවට බලය තිබිය යුතු ය.

කමිටුව විසින් අනුගමනය කළ යුතු විශේෂ විධිවිධාන.

(2) ගාස්තු සහ වෙනත් අයකිරීම් පැනවීම සඳහා අනුගමනය කළ හැකි විශේෂ කාර්ය පටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

**29.** නියමිත දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් සඳහා මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

මේ පනතේ කාලය.

**30.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

අර්ථ නිරූපණය.

**31.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස –

"ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත අදහස් වේ;

"ලංකා විදුලිබල පනත" යන්නෙන්, (205 වන අධිකාරය වූ) ලංකා විදුලිබල පනත අදහස් වේ;

"ලංකා විදුලිබල මණ්ඩල පනත" යන්නෙන්, 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත අදහස් වේ;

"ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත" යන්නෙන්, 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත අදහස් වේ;

"අපරාධ නඩු විධාන සංග්‍රහය පනත" යන්නෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදහස් වේ;

"විදුලිබල ශක්තිය" යන්නෙන්, පණිවුඩයක් සම්ප්‍රේෂණය කිරීමේ දී හැර වෙනත් කාර්යයක් සඳහා උත්පාදනය කළ, සම්ප්‍රේෂණය කළ, සැපයීම කළ හෝ භාවිත කළ බල ශක්තිය අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන් විදුලිබල හා බලශක්ති විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"ජාතික පාරිසරික පනත" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අදහස් වේ;

"පීඩාකාරී ආඥාපනත" යන්නෙන්, (230 අධිකාරය වූ) පීඩාකාරී ආඥාපනත අදහස් වේ;

"දණ්ඩ නීති සංග්‍රහය" යන්නෙන්, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය අදහස් වේ;

"තැනැත්තා" යන්නට, සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ කවර හෝ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"බනිජතෙල්" යන්නෙන්, බනිජතෙල් අදහස් වන අතර, හයිඩ්‍රොකාබන් හෝ හයිඩ්‍රොකාබන් සම්මිශ්‍රණයකින් පෙරාගත්, අත්කරගත්, සකස්කරගත්, වර්ධනය කරගත්, සම්මිශ්‍රණය කරගත්, සාදාගත් හෝ නිෂ්පාදනය කරගත් යම් නිෂ්පාදිතයක් හෝ අතුරු නිෂ්පාදිතයක් සහ ශාක හෝ සත්ව නාශක කෘමීන්ගේ සහ දිලීරවල ක්‍රියාකාරීත්වය විනාශ කිරීමේ හෝ යටපත් කිරීමේ හෝ පාලනය කිරීමේ කාර්ය සඳහා සහ ශාඛ ජීවයේ ඵලදායීතාවය හා ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස, කවරාකාර වූ හෝ විස්තරයකට අයත් කෘෂිකාර්මික රසායනික ද්‍රව්‍යයක් ලෙස භාවිත කර ඇත්තා වූ හෝ භාවිත කරන්නා වූ හෝ භාවිත කිරීමට අදහස් කරන්නා වූ යම් අකාබනික සහ ස්වාභාවික හෝ කෘත්‍රිම කාබනික සම්මිශ්‍රණයක් හෝ මිශ්‍රණයක් ඇතුළත් වේ;

"බනිජ තෙල් නිෂ්පාදන" යන්නෙන්, පෙට්‍රල්, භූමිතෙල්, වාහන ඩීසල්, ඝනත්වය වැඩි ඩීසල්, උදුන් තෙල්, දියර පෙට්‍රෝලියම් ගෑස් හෝ ගුවන් යානා ඉන්ධන අදහස් වේ;

"බනිජ තෙල් නිෂ්පාදන (සැපයුම් විධිමත් කිරීමේ හා පාලනය කිරීමේ) පනත" යන්නෙන්, 1979 අංක 34 දරන බනිජ තෙල් නිෂ්පාදන (සැපයුම් විධිමත් කිරීමේ හා පාලනය කිරීමේ) පනත අදහස් වේ;

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.